**පොල්පිතිගම ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 10 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ කොන්ක්‍රීට් ව්‍යාපෘතියෙන් ලැබූ රු. 283,270 ක අලාභය ආදායම් හා වියදම් ගිණුමට ගෙන නොතිබුණි. | ආදායම් හා වියදම් ගිණුමේ ගැලපීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී සමුච්චිත අරමුදලට ගැලපීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු. 476,000 ක වීථි පහන් උපකරණ ගිණුමට ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයේ මිලදී ගැනීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. |
| (ඇ) | ඉඩම් හා ගොඩනැගිලි උපලේඛන නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහනක් මඟින් රු. 569,473 ක වටිනාකමක් වත්කම් නිශ්චිතව හඳුනා ගෙන ගිණුම් ගත නොකිරීම හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලි එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | නිශ්චිතව හඳුනාගත් වත්කම් උපලේඛන සහිතව නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | 2008 වර්ෂයේ සිට ඉදිරියට එන ශේෂයන් බැවින් සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ඉදිකිරීම් 3 කට අදාළ රු. 422,270 ක රැඳවුම් මුදල ගෙවිය යුතු ශේෂයක් ලෙස සටහන් නොකර ජර්නල් සටහන් 42 මඟින් සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | රැඳවුම් මුදල් ගෙවිය යුතු ශේෂයක් ලෙස සටහන් කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 කට අදාළව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශේෂයන් හා උපලේඛන අතර රු.8,286,719 ක වෙනසක් පැවතුණි. | අදාළ ශේෂ වල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී උප ලේඛන හා ගිණුම් අතර ශේෂයන් සසඳා නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | වටිනාකම රු.121,194,369 ක් වූ ගිණුම් ශේෂයන් 08 කට අදාළව සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | අදාළ නිලධාරීන්ගෙන් මේ පිළිබඳව විමසීම් සිදුකර අදාළ සාක්ෂි ඉදිරි වර්ෂයේදී ලබාගෙන ඉදිරිපත් කරමි. |

## 1.4 අනුකූල නොවීම්

-------------------

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

-----------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (i) වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වූ නව සංවර්ධිත ප්‍රදේශවල පිහිටි දේපල හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | දැනට සංවර්ධන ප්‍රදේශ හඳුනාගෙන ඇතත් ඉදිරි වර්ෂයේදී තවදුරටත් සංවර්ධිත ප්‍රදේශ හඳුනාගෙන කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(2) | වසර 02 ක් ඉක්මවූ පොදු තැන්පත් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී ආදායමට ගැනීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 10,243,418 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 12,636,803 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම් | 2018 බිල්කළ ආදායම් | 2018 රැස් කළ ආදායම් | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම් | 2017 බිල්කළ ආදායම් | 2017 රැස් කළ ආදායම් | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු කුලී | 1,975 | 11 | 2,357 | - | 316 | 438 | 424 | - |
| කුලී | 7,585 | 6,780 | 7,775 | 11 | 6,998 | 6,696 | 6,635 | 11 |
| බලපත්‍ර ගාස්තු | 850 | 2,275 | 1,066 | - | 2,180 | 2,737 | 2,726 | - |
| වෙනත් ආදායම් | 76,381 | - | 56,318 | 19,651 | 59,919 | 50,813 | 57,141 | 26,478 |
| එකතුව | 86,791 | 9,066 | 67,516 | 19,662 | 69,413 | 60,684 | 66,926 | 26,489 |

#### 2.2.2 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ රැස්කළ බලපත්‍ර ගාස්තු රු.මිලියන 2.7 ක් වුවද, බලපත්‍ර ගාස්තු අය කිරීමේ ප්‍රමාදයන් හා සෞඛ්‍ය සේවා බලපත්‍ර ගාස්තු අඩුවෙන් අය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රැස්කළ බලපත්‍ර ගාස්තු රු. මිලියන 1 ක් දක්වා අඩු වී තිබුණි. | බලපත්‍ර ගාස්තු අය කළ යුතු වේ. | පළපුරුදු නිලධාරියෙකු ඉවත් කර නවක නිලධාරියෙකු අනුයුක්ත කිරීම හේතුවෙන් හඳුනාගෙන අය කර ගැනීමට ප්‍රමාද විය. |

**2.2.3** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට මුදල් ලැබිය යුතු උසාවි දඩ රු.5,160,000 ක් ලෙස ගිණුම් මගින් හෙළිදරව් කර තිබුණද 2018 නොවැම්බර් මාසයට අදාළ රු. 590,500 ක් හා දෙසැම්බර් මාසයට අදාළ උසාවි දඩ මුදල් ලැබිය යුතු ශේෂය තුළ ඇතුළත් වී නොතිබුණි. | උසාවි දඩ මුදල් නිවැරදිව හදුනාගෙන ගිණුම් ගත කළ යුතු වේ. | වර්ෂයට අදාළ නිවැරදි ආදායම පළාත් සභාවෙන් හදුනාගෙන අයකර ගැනීමට ප්‍රමාද විය. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ලෙස රු. 9,156,000 ක් ගිණුම් මගින් හෙළිදරව් කර තිබුණද 2018 ජුලි 01 සිට 2018 දෙසැම්බර් 31 දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මුද්දර ගාස්තු නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | වර්ෂයට අදාළ නිවැරදි ආදායම පළාත් සභාවෙන් හදුනාගෙන අයකර ගැනීමට ප්‍රමාද විය. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 12 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අවශ්‍යතාවය අනුව අතුරු ව්‍යවස්ථා පැනවීමටත්, පනවා ඇති අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කටයුතු කිරීමත් සිදු කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා සැකසීමේ කටයුතු සභාවට යොමු කර කටයුතු කරමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා හා සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 12 ආවරණය වන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොමැත. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නොදිරන කසල ප්‍රතිචක්‍රීකරණය කිරීමට හෝ විකුණා ආදායම් ලබා ගැනීමට කටයුතු නොකර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ පිටුපස වැළලීම සිදු කරමින් තිබුණි. | ඝන අපද්‍රව්‍ය නිසි පරිදි කළමනාකරණය කළ යුතු වේ. | ඝන අපද්‍රව්‍ය මෙම ඉඩමේ වැළලීම සිදු කර ඇතත් මෙයින් හානියක් නොවන බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විසින් දැනුවත්ව සභා බල ප්‍රදේශයේ ජනතාවගේ විවිධ වූ අවශ්‍යතා වෙනුවෙන් වැඩසටහන් 15 ක් ක්‍රියාත්මක කර තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට අදාළව වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතු වේ. | වැඩ සටහන් 15 ක් ක්‍රියාත්මක කර ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත 1999 ජූලි 13 දින වාර්ෂිකව සියයට 2.5 පොලියක් මත ශ්‍රී ලංකා පළාත් පාලන සේවක මහා සංගමයේ තැන්පත් කර තිබූ රු. 50,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ පොලිය වාර්ෂිකව අයකර ගැනීමට හෝ ආයෝජන මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව සඳහන් කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තෘතීක තනතුරක පුරප්පාඩු 01 ක් ද, ද්විතීක තනතුරක පුරප්පාඩු 08 ක් ද, ප්‍රාථමික තනතුරක පුරප්පාඩු 07 ක් ද පැවති අතර, අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා අනියම්/ කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 08 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | අදාළ පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අතිරික්ත කාර්යය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කරමි. |

## 3.4. වත්කම් කළමනාකරණය

### 3.4.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2003 වර්ෂයේ සිට සභාව විසින් භාවිතා කරන මිනි කුබෝටා ට්‍රැක්ටරයක්, යතුරු පැදියක්, ප්‍රාදේශිය ලේකම් සතුව පැවති පුරනැගුම ගොඩනැගිල්ල පවතින ඉඩම හා සභා බල ප්‍රදේශයේ සුසාන භූමි 128 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නීත්‍යානුකූල ලියවිලි නොමැති බැවින් සභාවට පවරා ගැනීමට නොහැකි වීම, පුරනැගුම ඉඩම පවරා ගැනීමට කටයුතු කරන බව හා සුසාන භූමි 129 න් එකක් පවරාගෙන ඇත. 128 ක් පවරා ගත යුතු අතර මැනීම් කටයුතු සඳහා අධික වියදමක් දැරීමට සිදු වීම මේ සඳහා හේතු වී ඇත. |

### 3.4.2 නිශ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කුබෝටා අත් ට්‍රැක්ටරයක් හා යතුරු පැදියක් වර්ෂ ගණනාවක සිට නිෂ්කාර්යව පැවති නමුත් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් කළ නිර්දේශ අනුව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | භාවිතයට ගනු නොලබයි. |

### 3.4.3 අය නොවන සේවක ණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ස්ථාන මාරුවී ගිය සේවකයෙකුගෙන් රු.232,406 ක් ද විශ්‍රාම ලැබූ සේවකයෙකුගෙන් රු. 3,541 ක් හා මියගිය ආදේශක කම්කරුවන් 03 දෙනෙකුගෙන් රු. 3,212 ක් වශයෙන් එකතුව රු. 239,159 ක් අය නොවන ණය වශයෙන් පැවතුණි. | අය නොවන සේවක ණය අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ස්ථාන මාරුවී ගිය නිලධාරිනියගේ වැටුපෙන් අඩු කර ගන්නා බව දැන්වූවද සභාවට ගෙවා නොමැත. |

### 3.5 ප්‍රසම්පාදන

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී ඉදිරිපත් කරන බව දන්වමි. |

### 3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ නොදිරන කසල ගබඩා කිරීමට රු. 733,687 ක් වැයකර ගොඩනැගිල්ලක් ඉදි කිරීම (දෙවන අදියර) කර්මාන්තයේ වැඩ විෂය අංක 01 යටතේ මිලි මීටර් 28 ඝනකම ලෑලි භාවිතයෙන් දොරවල් සපයා සවි කිරීමට වර්ග මීටර් 6.39 ක් සඳහා රු. 104,796 ක් ගෙවා තිබුණු නමුත් සපයා සවිකර තිබුණු දොර පියන්වල ලෑලි ඝනකම මිලි මීටර් 23 ක් පමණ විය. දොර පියන් උළුවහු ලී සඳහා සවි කිරීමට උපදෙස් පරිදි පිත්තල සරනේරු භාවිතා කළ යුතු වුවද, පිත්තල වර්ණය | ඉදිකිරීම් කටයුතුවල අඩුපාඩු සකස් කළ යුතු වේ. | පිළිසකර කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | ආලේප කළ සරනේරු සවිකර තිබුණි. දොර පියන් 4 ක් සපයා සවිකර තිබුණු අතර සියලු දොර පියන්හි මිලි මීටර් 10 ක පමණ විවර සහිතව ලෑලි ඇත්වී තිබුණි. | | |
| (ආ) | 2015 දෙසැම්බර් 30 දිනැති මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2016/01 හි 1.2 ඡේදය ප්‍රකාරව මාර්ග ඉදිකිරීමේදී මෙන්ම වැඩිදියුණු කිරීමේදී බොරළු දැමීම වැනි තාවකාලික වැඩ නොකළ යුතු ලෙස දක්වා තිබුණද 2016 වර්ෂයේ මාර්ග 03 ක බොරළු යෙදීම සඳහා රු. 422,278 ක් හා 2018 වර්ෂයේ මාර්ග 11 ක බොරළු ඇතිරීම වෙනුවෙන් රු. 1,367,391 ක් වැයකර තිබුණු අතර පරීක්ෂණ අවස්ථාව වන විට මාර්ග වල බොරළු සේදී ගොස් තිබුණි. | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු වේ. | මාර්ග සෝදා පාළුවට ලක්වී ඇත. |
| (ඇ) | උතුරුවැල්ල ජල ව්‍යාපෘතියේ ජල ටැංකි ඉදි කිරීමේ කර්මාන්තයේ වැඩ විෂය අංක 04 සිට 15 දක්වා ඉදිකිරීම 1:1 ½ :3 (20 m) කොන්ක්‍රීට් කිරීමට ඝණ මීටර් 16.99 සඳහා රු.379,355 ක් ගෙවා තිබූ නමුත් කොන්ක්‍රීට් කුළුණු හා තලාද සම්බන්ධවන ස්ථානවල අඩි 3 x 1 ප්‍රමාණයේ මී වද මෙන් දිස්වෙන ස්ථාන 08 ක්, ජල ටැංකිය ඉදි කර තිබූ කොන්ක්‍රීට් තට්ටුව ස්ථාන 05 ක අඩි 2 x 1 ප්‍රමාණයේ මී වද මෙන් දිස්වෙන ස්ථාන පැවතුණි. වැඩ විෂය අංක 47 සිට 56 දක්වා ජලය රැස් කරන පෙරෝ සිමෙන්ති ටැංකිය ඉදි කිරීම සඳහා රු. 352,995 ක් ගෙවා තිබුණද ටැංකියේ ස්ථාන 04 ක පිපිරීම් හා කඩතොලු සහිත ස්ථාන පැවතුණි. | ඉදිකිරීම් කටයුතු නිසි අධීක්ෂණයන් යටතේ විධිමත්ව ඉටු කළ යුතු වේ. | පිළිගනිමි. |

**3.5.3 අධිභාර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 මැයි 20 දින නිකුත් කළ රු. 1,283,910 වටිනාකම වූ අධිභාර 04 ක් | අධිභාර මුදල ගෙවීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රධාන අමාත්‍යාංශයේ පරීක්ෂාව අවසන් වන තෙක් කටයුතු කළ |

| | | |
|---|---|---|
| සම්බන්ධයෙන් 2019 අගෝස්තු 31 වන විටත් කටයුතු අවසන් කර නොතිබුණි. | | නොහැක. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරීන් පත්කර තිබුණද එම නිලධාරියාට වෙනත් රාජකාරීද පවරා තිබූ බැවින් සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන සැලසුම් සකස් කර ඒ අනුව විගණනය සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයට විමසුම් 03 ක් සහ 2019 වර්ෂයට විමසුම් 02 ක් ඉදිරිපත් කර ඇත. |